රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - **2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවාදැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසරදී ඇති විටක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු නියෝජිත කොමිස් ගිණුමේ පැවති රු.මිලියන 13.39 ක හර ශේෂ එදිනට රු.මිලියන 42.29 ක් වූ බැර ශේෂවලට එරෙහිව හිලව් කර දක්වා තිබුණි. | නියෝජිත කොමිස් ගිණුමේ පවතින නොසැසඳුන හර ශේෂය වූ රු.මිලියන 13.46 2011 වර්ෂයට පෙර සිට පවතින පැරණි ශේෂයක් බැවින් ආයතනයක් හෝ පුද්ගලයෙකු ගෙන් ලැබිය යුතු ලෙස නිශ්චිතව දැක්වීම අපහසු බව, දැනට පොත් වලින් ලියා හැරීම සඳහා විගණන කමිටුවේ අනුමැතියද ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද ඉදිරිපත් කර ඇති බැවින් පෙර පරිදිම නියෝජිත කොමිස් යටතේ දක්වා ඇති බව හා විගණන කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පොත් වලින් ලියා හැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත යවා ඇති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි 36 (අ) ඡේදය ප්‍රකාරව, භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුලුව තොග මැනීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, ඖසුසැල්වල ඉතිරි තොග සම්බන්ධයෙන් එම හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි | සංස්ථාව පිරිවැය සූත්‍රයක් භාවිතා නොකරන බව, වෙළඳපල මිල මට්ටම හා අනෙකුත් ඖෂධ වෙළඳපල තත්ත්වයන් සළකා බලා ඖෂධ මිල තීරණය කරන බව, ඖසුසැල්වල ඉතිරි තොග උපලබ්ධි නොවූ ලාභ ගැලපීමෙන් පසුව දක්වා ඇති බව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි 36 (අ) ඡේදය ප්‍රකාරව, තොග මැනීමේදී යොදා | තොග මැනීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනයේ 4.7.3 ඡේදය යටතේ දක්වා නොතිබුණු බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව |

| | | |
|---|---|---|
| | ගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූලා ප්‍රකාශනයේ 4.7.3 ඡේදය යටතේ දක්වා ඇති බව. | කටයුතු කළ යුතුය. |
| **(ඇ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 29.84 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ දුෂ්කරතා මතුවූ නමුත් 2021 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** 2020 දෙසැම්බර් 31 දිනට ඔසුසල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස හඳුනාගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතු වුවද, ඉතිරි තොගවල පිරිවැය නිශ්චිතව හඳුනා නොගෙන තොග හුවමාරු වටිනාකමින් සියයට 7.42 කට සමාන රු.මිලියන 48.93 ක් නොඉපයූ ලාභ ලෙස වෙන්කර තිබුණි. | ප්‍රධාන ගබඩාවෙන් ඔසුසැල්වලට මාරුකර තිබුණු ආනයනික ඖෂධවලින් වර්ෂය අවසානය වන විට ඉතිරිව තිබුණු තොගයේ හුවමාරු වටිනාකම නිවැරදිව ගණනය කිරීම සඳහා නිර්මිත වූ පරිගණක පද්ධතියක් සංස්ථාව සතුව නොමැති බව, සංස්ථාව විසින් ඔසුසැල් සාමාන්‍ය තොගයෙන් හුවමාරු ප්‍රතිශතය ඉවත්කර ලබාගත් ඇස්තමේන්තුගත ක්‍රමවේදයකට වර්ෂය අවසානයේ ඉතිරිව ඇති තොගයේ හුවමාරු වටිනාකම ගණනය කරන බව හා එය විගණනය විසින්ද පිළිගෙන වර්ෂ ගණනාවක සිට ක්‍රියාත්මකව තිබුණු බව හා නව පරිගණක පද්ධතිය ක්‍රියාත්මක වූ විට වඩාත් නිවැරදි ක්‍රමවේදයක් ඉදිරියේදී අනුගමනය කළ හැකි බව. | ඔසුසල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස නිශ්චිතව හඳුනාගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතුය. |
| **(ආ)** 2018 වර්ෂයට අදාළ රු.මිලියන 30.28 ක්වූ හරපත් 03 ක් දෙවරක් ගිණුම්ගත කර තිබීමේ වරද මෙන්ම 2019 වර්ෂයට අදාළ රු.මිලියන 10.84ක්වූ හරපත් 07 ක් පසුව අවලංගු කිරීමේ ගනුදෙනුව අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, ඒ වෙනුවට සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගැනුම් හා විකුණුම් ගිණුම් රු.මිලියන 39.54 ක් බැගින් හා සේවා ගාස්තු ආදායම් ගිණුම රු.මිලියන 1.58 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට යොමුකරන ලද හරපතක වරදක් නිවැරදි කිරීමේ දී හරපතේ වටිනාකමේ ප්‍රමාණාත්මක බව සලකා බලා එය ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගලපන හෝ නොගලපන බව තීරනය කරන බව, ඉහත සඳහන් කර ඇත්තේ හරපත් තුනක වටිනාකමක් වන බව, මෙම වර්ෂයේදී එකවර ගිණුම් ගතකර ඇති බව හා කෙසේ වුවත් මෙහි හරපත් වටිනකම මුළු විකුණුම් වටිනකමින් සියයට 1 ට වඩා අඩු බව. | මෙම වරද නිවැරදි කර 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂ කිහිපයකදී සැපයුම්කරුවන් 15 දෙනෙකුගෙන් මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු වෛද්‍ය සැපයීම් වෙනුවෙන් භාණ්ඩ ලැබීම් පත්‍ර සමඟ ඉන්වොයිස් සංස්ථාව වෙත ලැබී නොතිබීම හේතුවෙන් විගණිත දිනය වූ 2021 මාර්තු 24 දින වන විටත් ගිණුම්ගතවී නොතිබුණු ගැනුම් හා විකුණුම් වට්ටනාකම රු.මිලියන 58.68ක්වූ අතර ඊට අදාළ සේවා ගාස්තු ආදායමද ගිණුම් ගත කර නොතිබුණි. | වෛද්‍ය සැපයීම් අංශය විසින් අදාළ ලේඛන ලබාදීමේ ප්‍රමාදයක් පවතින බව, මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා සංස්ථාව විසින් නව ක්‍රමවේදයක් යෝජනා කර 2021 නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක කර ඇති බව. | ගැනුම් හා විකුණුම් වටිනාකම් හා සේවා ගාස්තු නිවැරදි අවස්ථාවලදී හඳුනාගෙන ගිණුම් ගත කිරීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරු වලට අනුව, 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත නිකුත්කර තිබුණු ප්‍රධාන ඇනවුම ප්‍රමාදවීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අයිතම වර්ග 98 ක් දේශීය වෙළඳපලින් මිලදී ගැනීමට සිදුවී තිබුණු අතර වැයකිරීමට සිදුවී තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 565.40 ක් විය. 2021 ඔක්තෝබර් 07 දින වන විට ඉන් රු.මිලියන 103.09 ක් පමණක් සැපයුම්කරුවන්ගෙන් අයකර මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණු නමුත් ඉතිරි රු.මිලියන 462.30 ක් අයකර ගත යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ ගිණුම්ගත කිරීමට හෝ හෙළිදරව් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟවන බව හා අය කර ගැනීම් ඉක්මන් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇති බව. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම් කාර්යක්ෂම කළ යුතු අතර ගිණුම්ගත කිරීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව, 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී සංස්ථාවේ අලෙවිය සඳහා විදේශීය හා දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණු වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත්වීම, අඩුවෙන් සැපයීම, ප්‍රතික්ෂේපිත තොග පැවතීම හා හානිවූ තොග පැවතීම ආදී වූ කරුණු හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන්ගෙන් අයවිය යුතු රු.මිලියන 92.03 ක් අයකර ගැනීමට හෝ ගිණුම්ගත කිරීමට හෝ හෙළිදරව් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | මූලික ගණකාධිකරණ මූලධර්මයක් වන විචක්ෂණතාවය යටතේ දක්වා ඇති අලාභ ගිණුම් ගත කිරීමට නොහැකි බව. | සැපයුම්කරුවන්ගෙන් අය විය යුතු වටිනාකම් ගිණුම් ගත කිරීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කළයුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම්

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) | 1996 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ඔසුසැල් මගින් අලෙවි කිරීම සඳහා මිලදී ගෙන තිබුණු වෛද්‍ය සැපයීම්වලින් 2020 දෙසැම්බර් 31 දිනට තත්ත්වයෙන් අසමත්වී තිබුණු වෛද්‍ය සැපයීම්වල පිරිවැය | 111.84 | 91.61 | 20.23 | තත්ත්වයෙන් අසමත් ඖෂධවල පිරිවැය හා තොග සත්‍යාපන වාර්තාවේ වටිනාකම අතර රු.මිලියන 20.23 ක් වූ වෙනස ඇතිවීමට හේතු සොයා බැලීම සඳහා සංස්ථාව විසින් විමර්ශනයක් පවත්වන බව හා විමර්ශන වාර්තාව ලැබීමෙන් පසු වෙනස ලියා හැරීමටත් විමර්ශනයේ නිගමන මත ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | වෙනසට හේතු හඳුනාගැනීමට, අවශ්‍ය ගැලපීම් කිරීමට හා අදාළ පරිදි මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතු ශේෂය | 34,424 | 34,020 | 404 | මෙම වෙනස සැසඳීම සඳහා වෛද්‍ය සැපයුම් අංශය තහවුරු කළ ශේෂයේ විස්තරාත්මක ලේඛනයක් එම ආයතනයෙන් ඉල්ලා ඇති බව හා ඒ අනුව වෙනසට හේතුව සොයා බැලීමට කටයුතු කරන බව. | වෛද්‍ය සැපයුම් අංශය සමඟ ශේෂ සැසඳුම් පිළියෙළ කර අදාළ වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | | | |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන් 447 කට අදාළ ශේෂ | 138.81 | ශේෂ සනාථ කිරීම | සියළුම ණයගැතියන් වෙත නිසි පරිදි ශේෂ තහවුරු කරන ලෙස හා විගණනයට | ශේෂ සනාථ සහතික මගින් ණයගැති ශේෂ තහවුරු කර ගත |

| | | |
|---|---|---|
| | පිටපතක්ද සහිතව එවන ලෙස තැපැල් මගින් දන්වා යවා ඇති බව. | යුතුය. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට 267.97 වෙළඳ ණයහිමියන් 101 කට අදාළ ශේෂ | මෙම ශේෂයෙන් වැඩි ප්‍රමාණයක්, ඖෂධ සැපයුම්කරුවන් වෙත ගෙවීමට ඇති ශේෂ වන බව හා මේ සඳහා අදාළ රෝහල් වෙතින් මුදල් ලද පසු සැපයුම්කරුවන් වෙත ගෙවීම් කරන බව. | ශේෂ සනාථ සහතික මගින් ශේෂ තහවුරු කර ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2007, 2008, 2009 හා 2012 වර්ෂවලට අයත් පිරිවැය රු.මිලියන 2 ක් වූ නිරාකරණය නොවූ මාර්ගස්ථ තොග (Disputed Goods in Transit) හා 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ වර්ෂ 5 කට අයත් වෛද්‍ය සැපයුම් අංශයෙන් අයකර ගත යුතු රු.මිලියන 12.60 ක් වූ රේගු ගාස්තු වෙනුවෙන් 2013 වර්ෂයේ සිට වෙන්කිරීම් සිදු කර තිබුණු නමුත් වෛද්‍ය සැපයුම් අංශයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැරණි ණය ශේෂ භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව කපාහැරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අයවිය යුතු මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු රු.මිලියන 34,424.92 කින් රු.මිලියන 211.59 ක් වර්ෂ 11 ත් වර්ෂ 22 ත් අතර කාලයක සිට පියවා ගැනීමට අපොහොසත්වී තිබුණි. | රජයේ වෛද්‍ය සැපයුම් අංශය වෙත භාණ්ඩ බාරදෙන අවස්ථාවේදීම ඒවා භාරගෙන ලේඛනගත කිරීමේ ක්‍රමවේදයක් එකල නොතිබීම නිසා මෙම තත්ත්වය ඇතිවූ බව, මෙම සියලු ශේෂයන් 2007 වර්ෂයට පෙර ඒවා වන අතර ඉන් පසු ශේෂයන් සියල්ල නිරවුල් කර ඇති බව හා පැරණි ණය ශේෂ භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව කපාහැරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | පැරණි ණය ශේෂ පියවා ගැනීමට හෝ විධිමත් අනුමැතියක් සහිතව ලියාහැරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට බහාලුම් තැන්පතු ගිණුමේ ශේෂය රු.මිලියන 16.48 ක් වූ අතර ශේෂ පත්‍ර දිනයෙන් පසු ඉන් රු.මිලියන 4.04 ක් පමණක් නැවත | 2020 දෙසැම්බර් 31 දිනට බහාලුම් තැන්පතු ශේෂය රු.මිලියන 16.48 ක් වුවද, වර්තමානය වන විට ඉන් රු.මිලියන 4.04 ක් නැවත අය කර ගෙන ඇති බව, වර්ෂ 02 | බහාලුම් තැන්පතු අයකර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයකර ගෙන තිබුණි. වර්ෂ 2 සිට වර්ෂ 14 දක්වා කාලයක සිට පියවා ගැනීමට අපොහොසත්වී තිබුණු ශේෂය රු.මිලියන 6.77 ක් වූ අතර ශේෂ පත්‍ර දිනයෙන් පසු ඉන් රු.178,984 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඒ අතරින් 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාළ රු.මිලියන 5.45 කින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගත නොහැකිවී තිබුණි. | ත් වර්ෂ 14 ත් අතර කාලය තුළ අය කර ගැනීමට තිබුණු රු.මිලියන 6.77 කින් රු.178,984 ක් අය කර ගෙන ඇති බව, එමෙන්ම එම කාල සීමාවට අදාළ රු.මිලියන 5.76 ක අගයක් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශය මත ගිණුම්වලින් කපා හැරීම සඳහා යොමු කර ඇති බව, පසුගිය කාල සීමාව තුළ රටේ පැවති තත්ත්වය හේතුවෙන් ලංකා නැව් සංස්ථාව ඇතුලු නාවික සමාගම් නිශ්කාෂන කටයුතු සඳහා පමණක් ප්‍රමුඛතාවය ලබාදීම හේතුවෙන් බහාලුම් තැන්පතු ශේෂය නැවත අය කර ගැනීමේ යම් ප්‍රමාදයක් ඇති වුවද ඉදිරියේදී එය කඩිනම් කිරීමට කටයුතු කරනබව. | |
| (ඇ) | සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව විකුණු දින සිට දින 30 ත් දින 45 ත් අතර කාලය තුළදී වෙළඳ ණයගැතියන්ගෙන් මුදල් අයකර ගත යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,426.07 ක් වූ ණයගැති ශේෂය තුළ වූ පුද්ගලික හා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු රු.මිලියන 13.05 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හා රු.මිලියන 39.57 ක් වර්ෂ 1 ත් වර්ෂ 5 ත් අතර කාලයක සිට හිඟව පැවතුණු අතර එම ශේෂයෙන් ශේෂ පත්‍ර දිනයෙන් පසු රු.මිලියන 6.23 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඒ අතරින් වර්ෂ 05 කට වඩා පැරණි රු.මිලියන 10.44 ක ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබුණි. | වර්ෂ 5 කට වැඩි පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු රු.මිලියන 13.05 න් රජයේ රෝහල් වලින් හා අනිකුත් ආයතන වලින් අයවිය යුතු අගය රු.මිලියන 2.29 ක් බව, දැනටමත් අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති අගය රු.මිලියන 10.44 ක් බව, වර්ෂ 1 ත් වර්ෂ 5 ත් අතර කාලයක සිට පුද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතන වලින් අයවීමට තවදුරටත් ඉතිරිව ඇති අගය වූ රු.මිලියන 33.34 තුළ රෝහල් වලින්, රාජ්‍ය ආයතන වලින්, පාර්ලිමේන්තු සංකීර්ණයෙන් හා පෞද්ගලික ආයතන වලින් ද අය විය යුතු අගයන් වන බව, ඒ තුළ වූ පාර්ලිමේන්තු සංකීර්ණයට ලබා දුන් ඖෂධ සඳහා වන මුළු ශේෂය වූ රු.මිලියන 14.62 ක් අය කර ගැනීම සඳහා කථානායකතුමා, සෞඛ්‍ය ලේකම්තුමා සහ අදාළ පාර්ශවයන් සමඟ කිහිප වතාවක් සාකච්ඡා කළද මෙම හිඟ මුදල පියවා ගැනීම සම්බන්ධයෙන් සතුටුදායක පිළිතුරක් අප වෙත නොලැබුනු බව, කෝප් කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කළ බව හා මෙම අයකර ගැනීම පිළිබඳව ගැටලුවක් ඇති බැවින් 2017 වර්ෂයේදී මෙම මුළු අගයට සමාන අගයක් බොල් හා අඩමාණ ණය ලෙස වෙන් කරඇති බව. | සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව ණය අය කර ගතයුතු කාලසීමාව තුළ හා ගිවිසුම් ප්‍රකාරව ණය අයකරගැනීම කාර්යක්ෂම කළ යුතුය. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 378.32 ක් වූ සැපයුම්කරුවන්ගෙන් ලැබිය යුතු අත්තිකාරම් (Advance receivable from Suppliers) අතරින් | අයකර ගැනීම් සම්බන්ධයෙන් අදාළ විධිවිධාන අනුගමනය කරමින් කටයුතු සිදු කරන බව හා වර්තමාන තත්ත්වය පිළිබඳ ලේඛනයක් විගණන අංශය වෙත ඉදිරිපත් | සංස්ථාවේ ප්‍රතිපත්ති හා ගිවිසුම්වලට අනුව සැපයුම්කරුවන්ගෙන් ලැබිය යුතු අත්තිකාරම් |

| | | |
|---|---|---|
| රු.මිලියන 1.13 ක් වර්ෂ 5 ත් වර්ෂ 12 ත් අතර කාලයක සිටද, එදිනට රු.මිලියන 32.35 ක් වූ සැපයුම්කරුවන්ගෙන් ලැබිය යුතු අයවීම් (claims receivable from suppliers) අතරින් රු.988,247 ක් වර්ෂ 02 කට අධික කාලයක සිටද අයකර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කිරීමට කටයුතු කරන බව. | නියමිත කාලසීමාවන් තුළදී අය කර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් හා වෙන් කිරීම් ගිණුමේ ශේෂය වූ රු.මිලියන 265.34 න් සියයට 15 ක් හෙවත් රු.මිලියන 40.81 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟවන බව, විවිධ හේතු නිසා අදාළ ගෙවීම් ප්‍රමාදවී ඇති නමුත් ගෙවිය යුතු වියදම් මෙලෙස උපචිත වියදම් ලෙස දක්වා ඇති බව හා මෙවැනි සියලු ගෙවීම් පිළිබඳ ඉදිරියේදී කටයුතු කරන බව. | උපචිත වියදම් නිරවුල් කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 13,887 කින් රු.මිලියන 80.50 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණු අතර 2021 අගෝස්තු 30 දින වන විට ඒ අතරින් රු.මිලියන 5.03 ක් පමණක් නිරවුල් කර තිබුණු බැවින් තව දුරටත් නිරවුල් කර නොතිබුණු ශේෂය රු.මිලියන 75.47 ක් විය. මේවා සියයට සියයක ණයවර ලිපි වට්නාකම් හා රැඳවුම් මුදල් වලින් සමන්විතවී තිබුණි. | මුදල් රෙගුලාසි 571(2) හි දක්වා ඇති පරිදි ආදායමට බැරකල පසු ආපසු ලබාගැනීමට කෙරෙන ඉල්ලීම් අවම කරගැනීම සඳහා විමසීම් කිරීමටත්, ආදායමට බැරකිරීම වසර 3 කට පසුව සිදුකිරීමටත් ප්‍රතිපත්තියක් ලෙස කටයුතු කරන බව. | දීර්ඝ කාලයක සිට සැපයුම්කරුවන් වෙත නිරවුල් කර නොතිබුණු ශේෂයන් පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළයුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය | රාජ්‍ය සංස්ථාවන්හි අතිරික්තයෙන් සෑම වර්ෂයකදීම පනතේ සඳහන් විසර්ජනයන්ගෙන් පසු ඉතිරිවන ශුද්ධ අතිරික්ත ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු වුවද, සංස්ථාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | මීට ඉහතදී මහා භාණ්ඩාගාරය විසින් සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සලකා බලා සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයට ලබාදිය යුතු ලාභ කොටස දන්වා එවනු ලබන අතර එය පදනම්ව ගෙවීම් සිදුකර ඇති බව හා මෙම වසරේ මේ දක්වා මහා | මුදල් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | භාණ්ඩාගාරය විසින් එලෙස ඉල්ලීමක් සිදුකර නොමැති බව. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ------------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 103, 104 හා 105 | 2020 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 121.89 ක් වූ ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත් වූ තොග සහ එදිනට පිරිවැය රු.මිලියන 33.43 ක් වූ ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 135,136,137, 138 හා 139 | සංස්ථාවේ වියදම් සඳහා බලයදීම, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම් කිරීම සඳහා වූ මූල්‍ය බලතල පැවරීමක් ලිඛිතව වාර්ෂිකව සිදුකළ යුතු වුවද, එලෙස මූල්‍ය බලතල පැවරීමක් සිදුකර නොතිබුණු අතර චෙක්පත් අත්සන් කිරීමේ බලතල පමණක් පවරා තිබුණි. | මුදල් රෙගුලාසි 135,136, 137,138 හා 139 ට අනුකූලව සහ සංස්ථාවේ පාලන පද්ධතියට අනුගත වන පරිදි සුදුසු ක්‍රමවේදයක් ඉදිරියේදී සැකසීමට කටයුතු කරන බව. | -එම- |
| (iii) | මුදල් රෙගුලාසි 210 (1) | සංස්ථාවේ ඔසුසල් සඳහා වෛද්‍ය සැපයීම් සපයනු ලබන සැපයුම්කරුවන් සංස්ථාව වෙත සිය මිල ගණන් ඉදිරිපත් කිරීමේදී දින 60 ක් ඇතුළත ගෙවීම් සිදුකළ හොත් ඉන්වොයිසි වටිනාකමින් සියයට 5ක වට්ටමක් ලබා දෙන බවට දැනුම් දී තිබුණි. නමුත් අදාළ ගෙවීම් දින 60 ක් තුළ සිදුකර නොතිබුණු බැවින් නියදි පරීක්ෂාවට ලක්වූ ඉන්වොයිස් 58 ක් සම්බන්ධයෙන් අහිමිව තිබුණු වට්ටම් මුදල රු.311,796 ක් වූ අතර වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම දින 60 කට පෙර සැපයුම්කරුවන් වෙත ගෙවීම් සිදුකළ අවස්ථාවලදී පවා සැපයුම්කරු විසින් ප්‍රදානය කර තිබුණු සියයට 5 වට්ටම් වාසිය ලබා ගැනීමට කටයුතු | නිරීක්ෂණ සමඟ එකඟවන බව, සැපයුම්කරුවන්ගෙන් වට්ටම් ලබා ගැනීමේ එකඟතාවයක් ඇති බව හා ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය කෙසේද යන්න පිළිබඳව ඉහළ නිලධාරීන්ගෙන් ලිඛිත හෝ වාචික උපදෙස් ගිණුම් අංශයේ අදාළ නිලධාරීන්ට ලැබී නැති බව, දැනට මේ සම්බන්ධයෙන් එම සැපයුම්කරුවන්ගේ ඉන්වොයිස් පත් වෙනුවෙන් කඩිනමින් ගෙවීම් කිරීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදී මේ වන විට ක්‍රියාවට නංවා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොකිරීම නිසා නියැදි පරීක්ෂාවට ලක්වූ ඉන්වොයිසි 10 ක් සම්බන්ධයෙන් අහිමිව තිබුණු වට්ටම් මුදල රු.36,556 ක් විය. | | |
| (iv) | මුදල් රෙගුලාසි 211 | සියලුම බැරකම් ඒවා සිදුවූ වහාම සටහන් කර ගත යුතු අතර සේවාවන් ඉටු කළ හෝ අවශ්‍ය සැපයීම් කළ හෝ ඉක්බිති හැකිතාක් ඉක්මණින් ඒ වෙනුවෙන් ගෙවීමට හැකිවනු පිණිස සැපයුම් සහ සේවාවන් සඳහා හෝ කරන ලද ඇණවුම් වැනි බැරකම් පිළිබඳව සටහන් යාවත්කාලීනව තබා ගැනීමට හා ඉන්වොයිස් ලැබුණු විට හරි වැරදි බලා අප්‍රමාදව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟවන බව, සංස්ථාවේ පවතින ප්‍රායෝගික ක්‍රියාවලියට අනුව බැරකම් සිදුවූ වහාම සටහන් කළ නොහැකිබව හා ගිණුම් අංශයට ලද පසු වහාම සටහන් තබන බව හා ලද උපදෙස් පරිදි ගෙවීම් සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (v) | මුදල් රෙගුලාසි 384 (3) | ලැබෙන සෑම චෙක්පොතක් පිළිබඳවම විස්තර එනම්, එය ලැබුණු දිනය, එහි ඇති චෙක්කොළ ගණන සහ ඒ ඒ පොතට අදාළ මුද්‍රිත අංක, චෙක්පත් ලිවීම සඳහා කාර්යාලයට ඒ ඒ චෙක්පොත් නිකුත් කළ දිනය, පොතෙහි අන්තිම චෙක් කොළය ලියූ දිනය සහ උප පත්‍රිකා විනාශ කළ දිනය ඇතුළත් කරමින් ලේඛනයක් පවත්වා නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟවන බව, වර්තමානයේදී මුදල් රෙගුලාසි 384 ප්‍රකාරව කටයුතු කරන බව. | -එම- |
| (vi) | මුදල් රෙගුලාසි 388 (1) | තැපෑලෙන් යවන සියලුම චෙක්පත් පිළිබඳව චෙක්පත ලියූ දිනය, චෙක්පත් අංකය, ඊට මුදල් ගෙවන බැංකුව, එය ලබන අය, චෙක්පතේ මුදල, වවුචර අංක යොමුව, යැවූ දිනය, මුදල ලැබුණු බව දැනුම් දෙන දිනය හා යැවීම භාර නිලධාරියාගේ කෙටි අත්සන ආදී වූ විස්තර අඩංගු වන ලේඛනයක් පවත්වා නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟවන බව, වර්තමානයේදී මුදල් රෙගුලාසි 388 ප්‍රකාරව කටයුතු කරන බව, තැපෑලෙන් යවන චෙක්පත් පිළිබඳ විස්තර සහිත ලේඛණය චෙක්පත් නිකුත් කරන නිලධාරියා විසින් පවත්වාගෙන යන බව හා මේ වන විට එම ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යන බව. | -එම- |
| (vii) | මුදල් රෙගුලාසි 389 (ආ) | අතට භාර දෙනු ලබන සෑම චෙක්පතක්ම භාරගත් බවට එහි අංකය, මුදල් ප්‍රමාණය, රේඛිතද නැද්ද, ඊට මුදල් ලබාගත යුතු බැංකුව, වවුචර අංකය සහ භාර දෙන ලද දිනය යන විස්තර ඇතුළත් ලියවිල්ලක් ලබාගත යුතු වුවත් චෙක්පත් අතට භාරදීම | නිරීක්ෂණ සමඟ එකඟවන බව, චෙක්පත් නිකුත් කිරීමේදී චෙක්පත් බාරගත් බවට චෙක්පතේ සඳහන් විස්තරය ඉදිරිපස ආදායකයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා අත්සන මෙන්ම අදාළ වවුචර | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් එවැනි ලියවිල්ලක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර චෙක්පත් අයිතිකරුවන්ට ලබාදීම සඳහා පවත්වාගෙන යනු ලබන ලේඛනයේ ගෙවීම් වවුචර් අංකය, ඉන්වොයිස් අංකය, ඇණවුම් අංකය යනාදී කිසිදු අත්‍යාවශ්‍ය තොරතුරක් ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව චෙක්පත නිකුත් කරන්නේ කුමන ඉන්වොයිසියක් හා කුමන වවුචරයක් යටතේද යන පසු විපරම සිදුකළ නොහැකි විය. | අංකයද අදාළ ලේඛනයේ සඳහන් කරන බව. | |
| (viii) | මුදල් රෙගුලාසි 391(ඇ) | චෙක්පතක වලංගුභාවය දීර්ඝ කිරීමේදී චෙක්පත්වල පිටසනට අත්සන් කරන නිලධාරීන් විසින් ඒ ඒ චෙක්පතෙහි උප පත්‍රිකාවෙහිද, ඊට පෙර මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි මුදල් නොකරන ලද චෙක්පත් පිළිබඳ ලැයිස්තුවෙහි නියමිත විෂය ඉදිරියෙන්ද එසේ වලංගුභාවය දීර්ඝ කරන බව රතු තීන්තෙන් ලියා සිය කෙටි අත්සන යෙදිය යුතු වුවත්, සංස්ථාවේ චෙක්පත්වල වලංගු කාලය දීර්ඝ කිරීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟවන බව, අවලංගු වන චෙක්පත් ලේඛනයේ සටහන් කරන බව හා උප පත්‍රිකාවල සටහන් යෙදීමට මේ වන විට කටයුතු කරනබව. | -එම- |
| (ix) | මුදල් රෙගුලාසි 392 (ආ) (iii) | චෙක්පත් නැතිවූ බව හෝ සොයා ගත නොහැකි බව ආදායකයකු විසින් වාර්තා කළහොත් මුදල් රෙගුලාසිවල දැක්වෙන ආකෘතිය ප්‍රකාර හානි රක්ෂණ ලිපියක් ලබා ගැනීමෙන් පසුව පමණක් ඒ වෙනුවට නව චෙක්පතක් නිකුත් කළ යුතු වුවද, එවැනි අවස්ථාවලදී හානි රක්ෂණ ලිපියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟවන බව, හානි රක්ෂණ ලිපියක් ලබා ගැනීමට නොහැකි නම් මේ පිළිබඳව භාණ්ඩාගාරයට දන්වා නියෝගයක් ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (x) | මුදල් රෙගුලාසි 394 (ආ) (i) | කිසියම් හේතුවක් නිසා චෙක්පතක් අවලංගු කළ යුතු කළ ඒ වෙනුවට චෙක්පතක් නිකුත් නොකරන්නේ නම් චෙක්පතේ උප පත්‍රිකාවේ හා මුදල් පොතේ අදාළ සටහන ඉදිරියේ අවලංගු කිරීම පිළිබඳ විස්තර සටහන් කළ යුතු වුවත් එලෙස සිදු කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟවන බව, අවලංගු වන චෙක්පත් ලේඛනයේ සටහන් කරන බව හා උප පත්‍රිකා සටහන් දැමීමට මේ වන විට කටයුතු කරන බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (xi) | මුදල් රෙගුලාසි 571 | 2020 දෙසැම්බර් 31 දිනට පැවති, තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් ඉක්මවා තිබුණු එකතුව රු.මිලියන 1.38 ක තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 (2) හි දක්වා ඇති පරිදි ආදායමට බැරකල පසු ආපසු ලබාගැනීමට කෙරෙන ඉල්ලීම් අවම කරගැනීම සඳහා විමසීම් කිරීටමත්, ආදායමට බැරකිරීම වසර 3 කට පසුව සිදුකිරීමත් සංස්ථාව ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කරන බව. | -එම- |
| (ඇ) | 2020 අප්‍රේල් 20 දිනැති අංක 758 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | 2020 මැයි 15 දින සිට සැපයුම්කරුවන්ට ගෙවීම් සිදුකිරීම විධිමත් කිරීම සඳහා පත් කර තිබුණු කමිටු අනුමැතියකින් තොරව සැපයුම්කරුවන් වෙත 2020 සැප්තැම්බර් 28 දින වන විට අවස්ථා 07 කදී රු.මිලියන 40.91ක් ගෙවා තිබුණි. | මේ වනවිට කමිටුවල ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට කටයුතු කරන බව. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට අනුකූලව කටයුතු සංවිධානය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,969,223,517 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,663,869,219 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.305,354,298 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම සියයට 22 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා පොලී වියදම පිළිවෙලින් රු.317,470,491 ක් හා රු.686,878,333 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 116 කින් වැඩි වී තිබුණි. වෛද්‍ය සැපයුම් අංශය වෙත සැපයුම් ප්‍රමාණය වැඩිවී තිබුණද, ඒ සඳහා මුදල් ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන් බැංකු අයිරා පහසුකම් වැඩියෙන් ලබා ගැනීම ඊට හේතු වී තිබුණි.
ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වැටුප්, වේතන හා දීමනා වියදම පිළිවෙලින් රු.786,727,155ක් හා රු.956,389,952 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 21 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සාමූහික ගිවිසුම මගින් සිදු කළ වැටුප්, වේතන හා දීමනා වැඩිකිරීම ප්‍රධාන වශයෙන් ඊට හේතුවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙළින් සියයට 0.7 කින් සහ සියයට 0.2 කින්ද, ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 0.3 කින්ද අඩුවී තිබුණු අතර ණය අයකර ගැනීමේ කාලය දින 22 කින් වැඩි වී තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කරමින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කර ගත යුතුය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීමේ නිශ්චිත ප්‍රතිපත්තියක් හා විනිවිදභාවයෙන් යුතු විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණු බැවින් කිසියම් සැපයුම්කරුවකුට ප්‍රමුඛත්වයක් ලබාදීමට හෝ අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩකඩ පැවතුනි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, මුදල් රෙගුලාසිවලට අනුව ක්‍රියාකිරීමට වර්තමානයේදී කටයුතු යොදා ඇති බව හා සියළුම ගණකාධිකාරිවරුන් වෙත අවශ්‍ය පරිදි බලය පවරා ඔවුන්ව දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසිවලට අනුගත වන පරිදි පවත්නා ක්‍රමවේදය සංශෝධනය කර එම ක්‍රමවේදයට අනුගතව කටයුතු කළ යුතුය. |
| (ආ) | චෙක්පත් මුද්‍රණය කිරීමෙන් පසු පළමු සහ දෙවන අත්සන සඳහා වගකිව යුතු නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම ලේඛන ගත කර නොතිබුණි. එසේම මිලියන 1 ට වැඩි වටිනාකමින් යුතු චෙක්පත්වල පළමු අත්සන සඳහා එක් නිලධාරියෙකු වෙත පමණක් බලය පවරා තිබුණි. තවද ඉන්වොයිසි ලද පිළිවෙලට ගෙවීම් වවුචර් පිළියෙල කර නොතිබුණි. චෙක්පත් අත්සන් කිරීමේදී අදාළ වගකිව යුතු නිලධාරීන් විසින් එම චෙක්පත් තමන් වෙත පැමිණි අනුපිළිවෙලට අත්සන් තබා නැවත යැවීමක් සිදුකර නොතිබුණු අතර ඇතැම් අවස්ථාවලදී ඒ සඳහා අසාමාන්‍ය කාල සීමාවන් ගතකර තිබුණි. එපරිදි චෙක්පත්වල වලංගු කාලසීමාව ඉක්මවීමට පෙර චෙක්පත් අත්සන් නොකිරීම හේතුවෙන් චෙක්පත් නැවත නැවතත් වලංගු කිරීමට සිදුවී තිබුණු අතර ප්‍රතිවලංගු කරනු ලබන චෙක්පත් ප්‍රමාණය පසුගිය වර්ෂ කීපය මුළුල්ලේ අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් තිබුණි. චෙක්පත් ප්‍රතිවලංගු කිරීමට හේතුවූ කරුණු ලේඛනගත කර නොතිබීම හේතුවෙන් ඒ පිළිබඳව පසුවිපරමක් සිදුකළ නොහැකි විය. | -එම- | -එම- |
| (ඇ) | වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානිවූ ඖෂධ සපයා තිබීම සහ ඖෂධ අඩුවෙන් සපයා තිබීම වෙනුවෙන් දරන ලද පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු හරපත්වල වටිනාකම රු.මිලියන 2,239.86 ක්වූ නමුත් ඉන් රු.මිලියන 807.48 ක් 2021 සැප්තැම්බර් 30 දින වන විටත් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. ඒ තුළ වූ 2021 සැප්තැම්බර් 30 දින වන විටත් අයකර | 2020 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබුණු හරපත්වල වටිනාකම වූ රු.මිලියන 2,239.86 කින් රු.මිලියන 24.73 ක් වූ හරපත් පසුව අවලංගු කර ඇති බව, ඉතිරියෙන් රු.මිලියන 146.92 ක් වූ හරපත් 2021 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී සැපයුම්කරුවන් වෙතින් අයකරගෙන ඇති බව, 2021 සැප්තැම්බර් 30 දින වන විට අසාදු ලේඛණ ගත කළ | තත්වයෙන් අසමත්, හානිවූ හා ඖෂධ ඌනතාවල පිරිවැයෙන් අයකර නොගත් ප්‍රමාණය සැපයුම්කරුගෙන් අයකර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙන නොතිබුණු රු.මිලියන 680.60 ක් අසාධු ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු වූ බැවින් අයකිරීම් අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. එසේම ඒ තුළ වූ තත්වයෙන් අසමත් පිරිවැය රු.මිලියන 95.54 ක් වූ වෛද්‍ය සැපයුම් අයිතම 14 ක් 2020 වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු ඖෂධ විය. | සැපයුම්කරුවන්ගෙන් අයකරගත යුතු හරපත්වල අගය රු.මිලියන 680.60 ක් වන බව, එම වටිනාකම අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග සංස්ථාවේ නීති අංශය විසින් සිදු කරමින් පවතින බව හා 2020 වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් මිලදී ගත් තොග අතරින් තත්ත්වයෙන් අසමත් වූ අයිතමයන්ගේ තොග වටිනාකමින් තවදුරටත් අයකර ගැනීමට ඇති වටිනාකම රු.මිලියන 95.54 ක් පමණක් බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී, වෛද්‍ය සැපයුම් අංශය විසින් තාවකාලිකව ප්‍රතික්ෂේප කර තිබුණු වෛද්‍ය සැපයුම් අයිතම 07 ක පිරිවැය රු.මිලියන 30.64 ක් හා හානිවී තිබුණු වෛද්‍ය සැපයුම් අයිතම 06 ක පිරිවැය රු.402,948 ක් 2021 සැප්තැම්බර් 30 දින වන විටත් අයකර ගැනීමට හෝ එම අයිතම ප්‍රතිස්ථාපනය කර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | 2020 වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු තොග අතරින් කොටසක් ප්‍රතික්ෂේප වී තිබීම මත රු.මිලියන 11.76 ක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට අදාළ හරපත් යොමුකර ඇති බව, මෙතෙක් නොවිසඳුනු තොගයන්ගේ වටිනාකම රු.මිලියන 18.86 ක් පමණක් වන බව හා 2020 වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු තොග අතරින් තොග හානිවීම් නිසා ප්‍රතික්ෂේප කරන ලද රු.402,948 ක් තවදුරටත් අයකර ගැනීමට ඇති බව. | තත්වයෙන් අසමත් හා හානිවූ ඖෂධ පිරිවැයෙන් අයකර නොගත් ප්‍රමාණය සැපයුම්කරුගෙන් අයකර ගැනීම කාර්යක්ෂමම කළ යුතුය. |
| (ඉ) | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් 2020 ජනවාරි 01 දින වන විට තත්ත්වයෙන් අසමත්, කල් ඉකුත්වූ හා හානි වූ ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 116.86 ක්වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී තත්ත්වයෙන් අසමත්, කල්ඉකුත්වූ හා හානිවූ ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 103.65 ක් විය. ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 33.43 කින් රු.මිලියන 16.16ක් 2021 නොවැම්බර් 02 දින වන විටත් අයකරගෙන නොතිබුණි. තවද ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඖෂධ කල්ඉකුත්වීම හා හානිවීම නිසා සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මුළු අලාභය රු.මිලියන 121.89 ක් විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | තත්ත්වයෙන් අසමත් ඖෂධවල වටිනාකම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමටත් ඖෂධ කල් ඉකුත්වීමට හේතු සොයාබලා පිළියම් යෙදීමට හා එම හේතුවලට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2005 වර්ෂයේදී චීනයෙන් ආනයනය කර වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබුණු Hypodermic | රු.මිලියන 17.51ක අලාභය සැපයුම්කරුවන්ගෙන් අය කර ගැනීම | අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් |

| | | |
|---|---|---|
| Syringes 5ml & 10ml අයිතම මිලියන 6 ක් තත්වයෙන් අසමත්වීම හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු රු.මිලියන 17.51 ක අලාභය නියමිත කාලය තුළදී සැපයුම්කරුගෙන් අයකර ගැනීම සඳහා කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පවත්වා තිබුණු විනය පරීක්ෂණ 02 කින් වැරදිකරු වී තිබුණු එවකට ආනයන කළමනාකරු වශයෙන් සේවය කළ නිලධාරිනිය මෙම අලාභය සඳහා වගකීමට යටත්කොට 2019 මැයි 15 දින විනය නියෝගයක් නිකුත්කර තිබුණි. නමුත් 2021සැප්තැම්බර් 30 දින වන විටත් අලාභය අය කර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | සඳහා කටයුතු නොකිරීම සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණ වලින් වරදකරුවී තිබුණු ආනයන කළමනාකාරිනිය වෙත 2019 මැයි 15 වන දින විනය නියෝගයක් ලබා දුන් බව, ඒ සම්බන්ධයෙන් චූදිත නිලධාරිනිය විසින් ඉදිරිපත් කර තිබුණු අභියාචනය අනුව, පවත්වා තිබුණු විධිමත් විනය පරීක්ෂණ දෙකෙහි තීරණ නැවත විමර්ශනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ බව, එම නැවත විමර්ශනය පිළිබඳ වාර්තාවට අනුව චූදිත නිලධාරිනියට එරෙහිව නගා ඇති චෝදනා 05 න් 03 කට වරදකරු බවත් චෝදනා 02 ක් ඔප්පු නොවන බවත් තීරණය කර ඇති බව, අලාභය සැපයුම්කරුවන්ගෙන් අය කර ගැනීම සඳහා වගකිවයුතු අය වන්නේ චූදිත නිලධාරිනිය යැයි චෝදනා කර තිබීම ඉදිරිපත්වී ඇති සාක්ෂි අනුව පිළිගත නොහැකි බව දක්වා ඇති බව, මේ නිසා එසේ අය කර ගැනීම සඳහා කිනම් අය වගකිවයුතුද යන්න සොයා ගැනීම සඳහා නැවත විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශන අංශයේ පරීක්ෂණ නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර ඇති බව. | අය කර ගැනීම කාර්යක්ෂමව කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා 2018/2019 වර්ෂ තුළදී Dopamine Injection 200mg/5 ml ඒකක 120,000 ක් මිලදී ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ක්‍රමයට ලංසුකැඳවා තෝරාගෙන තිබුණු සැපයුම්කරුවෙකු වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණු අතර ඒකක් රු.33.43 ක් බැගින් ඒකක 120,000 ක මුළු පිරිවැය රු.මිලියන 4.01 ක් විය. මෙම ප්‍රධාන ඇණවුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) එම ප්‍රධාන ඇණවුම ප්‍රමාදවීම හේතුවෙන් Dopamine Injection 200mg/5 ml ඒකකයක් රු.940 බැගින් ඒකක 12,994 ක් ප්‍රධාන සැපයුම්කරුගේ දේශීය | ලංසු ඇගයීමේ ප්‍රමාදයක් සිදුවී ඇති බව පිළිගත නොහැකි බව, අදාළ ලිපිගොනුව තාක්ෂණ අංශයට ලැබී ඇත්තේ 2018 අගෝස්තු 20 දින වන | ප්‍රධාන ඇණවුම ප්‍රමාදවීම සඳහා වගකිවයුත්තන් නිශ්චය කිරීමටත්, |

| | | | |
|---|---|---|---|
| | නියෝජිතයාගෙන් සහ ඒකක 14,995 ක් වෙනත් සැපයුම්කරුවෙකුගෙන් මුළු මුදල රු.මිලියන 26.31 ක් වැයකර දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණි. ප්‍රධාන ඇණවුමේ මිල හා දේශීය වෙළඳපලේ මිල අතර විචලනය සියයට 2,712 ක් වුවද ඒ පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ අවධානය යොමුකර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 7.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම සිදුකර නොතිබීමත්, සැපයුම්කරුගේ ප්‍රමාදයත්, ප්‍රධාන ඇණවුම ප්‍රමාදවීමට හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය. නමුත් ප්‍රසම්පාදන කොන්දේසි ප්‍රකාරව සැපයුම්කරුගේ වරදකින් සැපයුම ප්‍රමාදවීම තුළ දේශීයව මිලදී ගැනීමට සිදුවීමෙන් දැරීමට සිදුවී තිබුණු අතිරේක පිරිවැයෙන් රු.මිලියන 23.23 ක් ප්‍රධාන සැපයුම්කරුගෙන් අයකර ගෙන නොතිබුණු අතර ලංසු ඇගයීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමටද කටයුතු කර නොතිබුණි. | බව, ලංසු ඇගයීම 2018 සැප්තැම්බර් 21 දින සිදු කර ඇති බව, ප්‍රසම්පාදන කාලසටහන අනුව ලබාදී ඇති කාලය ඇතුළත (සති 4) ලංසු ඇගයීම සිදුකර ඇති බව, ඉහත කී කාලය ඇතුළත තාක්ෂණ අංශය විසින් දළ වශයෙන් ලිපි ගොනු 1,800 කට ආසන්න සංඛ්‍යාවක ලංසු ඇගයීම, ඇගයීම් වාර්තා පිළියෙල කිරීම, රසායනාගාර තත්ත්ව වාර්තා පරීක්ෂා කිරීම සහ අනෙකුත් රාජකාරි කටයුතු සිදුකර ඇති බව, දක්වා ඇති අතිරේක පිරිවැය රු.මිලියන 26.31 ක් අය කර ගැනීම සඳහා හරපත් නිකුත් කර ඇති බව හා සැපයුම්කරු එම වටිනාකම ගෙවීම සඳහා ලිඛිතව එකඟවී ඇති බව. | වැයකර තිබුණු අතිරේක පිරිවැය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ii) | ප්‍රධාන ප්‍රසම්පාදනය සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් දෙදෙනා විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.3.11 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබුණි. | ලංසුකරුවන් දෙදෙනා විසින්ම ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නැති බව සඳහන් කර ඇගයීම් වාර්තාව පිළියෙල කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශසංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අධිහාර කළ යුතුය. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | සංස්ථාව අනුමත කරන ඉන්දියානු පර්යේෂණාගාරයක් වෙතින් නැව්ගත කිරීමට පෙර සාම්පල පරීක්ෂා කළ යුතු බවට වූ කොන්දේසිය වෙනුවට සංස්ථාවේ පර්යේෂණාගාරය වෙතින් සාම්පල පරීක්ෂා කළ යුතු බව ප්‍රධාන ප්‍රසම්පාදනයේ සැපයුම්කරු වෙත දන්වා තිබුණු නමුත් ඒ සඳහා සැපයුම්කරු අකමැත්ත ප්‍රකාශ කර තිබීම පිළිබඳව නොසලකා ඇනවුම ප්‍රදානය කර තිබුණි. | ඇමුණුම ප්‍රදානය කිරීමේ දී සංස්ථාවේ පර්යේෂණාගාරය වෙතින්ම පරීක්ෂා කළ යුතු බවක් දක්වා නොමැති බව. පූර්ව නැව්ගත කිරීමේ සාම්පල පමණක් පරීක්ෂා කළ යුතු බව පමණක් දක්වා ඇති බව. සංස්ථාවේ පර්යේෂණාගාරයේ පරීක්ෂා කිරීමට කළ යෝජනාවට සැපයුම්කරු එකඟ නොවූ බැවින් සංස්ථාව පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂා කර බලා තොගය භාරගෙන ඇති බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ අවශ්‍ය ඕනෑම අවස්ථාවක, අස්ථිත්වයට අවශ්‍ය පරිදි සපයනු ලබන ඖෂධවල ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ හැකියාව ප්‍රසම්පාදන අස්ථිත්වය සතු වන පරිදි කටයුතු කළ යුතුය. |
| (iv) | දේශීය වෙළඳපලින් මිලදී ගැනීමේ ලංසු ඇගයීමේදී මිල ගණන් සංශෝධනය කිරීම සඳහා ලංසුකරුවන් කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණු නමුත් එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදී තිබුණු දිනට පෙර දින ඇණවුම නිකුත් කර තිබුණි. ප්‍රසම්පාදන කොන්දේසි ප්‍රකාරව, මෙම එන්නත් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයන විට අවම වශයෙන් මාස 12 ක ජීව කාලයක් සහිත වියයුතු වුවද, එන්නත් 1,200 ක ජීව කාලය මාස 10 ක් පමණක් විය. | දක්වා ඇති තීරණය එවකට සිටි සභාපතිවරයා අදාළ ප්‍රසම්පාදන තීරණය අනුමත කිරීමේ දී ගෙන ඇති අතර, පසුව ප්‍රසම්පාදන කමිටුවද ඒ තීරණය සඳහා ආවරණ අනුමැතියක් ලබා දී ඇති බව. අඩු ජීව කාලය සමඟ වුවද තොගය වෛද්‍ය සැපයුම් අංශය විසින් භාරගෙන ඇති බව. | ප්‍රසම්පාදන කමිටු තීරණවලට අනුකූලව මෙන්ම ප්‍රසම්පාදන කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | සංස්ථාවේ අලෙවිය සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 1.64 ක් වැය කර Pioglitazone Hydrochloride Tablets 15 mg ඖෂධයේ 10*10 ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 17,700 ක් හා රු.මිලියන 10.38 ක් වැයකර 5*10 ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 66,300 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| **(i)** | 2017 ඔක්තෝම්බර් 31 දින ගැණුම් අධියාචනාව ඉදිරිපත් කරන අවස්ථාව වන විට පසුගිය ආසන්න මාස 12 ක කාල සීමාව තුළ මෙම ඖෂධයේ 10*10 හා 5*10 ප්‍රමාණයේ ඇසුරුම් ඒකකවල සත්‍ය වාර්ෂික විකුණුම් ප්‍රමාණය පිළිවෙලින් 12,232 ක් හා 63,030 ක් විය. ඇසුරුම් ප්‍රමාණ දෙකෙන්ම මෙම ඖෂධයේ අලෙවිය පහල යමින් පැවති අවස්ථාවක හා 10*10 හා 5*10 ප්‍රමාණයේ ඇසුරුම් වලින් පිළිවෙලින් ඒකක 13,000 ක් හා ඒකක 46,862 ක් වශයෙන් මුළු ඒකක 59,862 ක තොගයක් සංස්ථාව සතුව | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සිදුව ඇති අලාභය සඳහා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අය කර ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබියදී ඒ පිළිබඳව සැලකිලිමත් නොවී තවත් 10*10 ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 36,000 ක් හා 5*10 ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 48,000 ක් ඇණවුම් කිරීමට කටයුතු කර තිබුණි. එසේම ඇණවුමට අනුව මාස 6 ක කාල පරාසයක් තුළදී ඇණවුම සැපයිය යුතු වුවද, මුළු ඇණවුමෙන් සියයට 69.5 ක් මාස 2 ½ ක කාල පරාසයක් තුළදී සංස්ථාව වෙත භාරගෙන තිබුණි. එම හේතු නිසා පිරිවැය රු.මිලියන 1.61 ක් වූ 5*10 ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 10,353 ක් සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත්වී තිබුණි. ඊට අමතරව පිරිවැය රු.මිලියන 1.38 ක් වූ 5*10 ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 8,914 ක් නොමිලේ ප්‍රසාද වශයෙන් නිකුත් කර තිබුණි. | | |
| **(ii)** | ඖෂධය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි කළ සහතිකය ඉදිරිපත් කර නොතිබියදී පළමු අවම ලංසුවඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත මුළු ඇණවුමෙන් සියයට 60 ක් ප්‍රදානය කර තිබුණි. එම ලංසුකරු විසින් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකය (PCA 03)ද ඉදිරිපත් කර නොතිබුණි. තවද කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපියට අනුව, ඖෂධයේ ඇසුරුම් ලේබලය සංස්ථාවෙන් අනුමත කරවා ගැනීමට කටයුතු නොකර සංස්ථාව විසින් අනුමත නොකරන ලද ඇසුරුම් ලේබල සහිත පළමු ඖෂධ තොගය ලෙස 10*10 ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 17,700 ක් සංස්ථාව විසින් භාර ගෙන තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී අදාළ වන අණපනත් සහ ගිවිසුම්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | වෛද්‍ය සැපයුම් අංශය විසින් 2018 වර්ෂයෙහි අවශ්‍යතාවය ලෙස හඳුනාගෙන තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.2,450,000 ක්වූ Epoetin Injection 1,000IU / Vial pre- filled syringes (Recombinant Human Erythropoietin BP) එන්නතින් ඒකක 7,000 ක් රු.44,640,705 ක් වැයකර මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශයට අදාළ අංක 31 දරන අතිරේකය ප්‍රකාරව, ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමයට කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු සති 08 කින් නිම කළ යුතුවුවද, මෙම ප්‍රසම්පාදනය නිම කිරීම සඳහා වර්ෂ 2 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. මෙම ප්‍රසම්පාදනයට අදාළ කොන්ත්‍රාත් වටිනාකම USD 243,530 කට සමාන රු.මිලියන 43.46 ක් වුවත්, ප්‍රසම්පාදන කටයුතු සඳහා වර්ෂ 2 කට ආසන්න කාලයක් ගත කර තිබීම හේතුවෙන්, ගෙවීම් සිදුකරන අවස්ථාව වනවිට රුපියලක ඩොලර් අගය වෙනස්වීම මත මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් USD 243,530 කට සමාන රු.මිලියන 44.64 ක් සැපයුම්කරු වෙත ගෙවීමට සිදුව තිබුණි. ඒ අනුව වැඩියෙන් ගෙවීමට සිදුව තිබුණු මුදල රු.මිලියන 1.18 ක් විය. | මෙම මිලදී ගැනීම සඳහා සුදුසු ලංසු ඉදිරිපත් නොවීම මත කිහිපවරක්ම ලංසු කැඳවීමට සිදු වී ඇති බව, ඒ අනුව දක්වා ඇති ප්‍රමාදය සංස්ථාවේ පාලනයෙන් තොර නොවැලැක්විය හැකි ප්‍රමාදයක් බව හා දක්වා ඇති මුදලේ වෙනස විනිමය අනුපාතයේ ඇති වී ඇති වෙනසක් බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. |
| **(ii)** | වෛද්‍ය සැපයීම් අංශය විසින් 2018 වර්ෂය සඳහා Epoetin Injection 1000IU/Vial pre-filled syringes7,000 ක් මිලදී ගැනීම සඳහා සංස්ථාව වෙත ඉදිරිපත් කරන ලද ගැණුම් අධියාචනයට අනුව මෙම එන්නතෙහි එක් ඒකකයක ඇස්තමේන්තු ගත පිරිවැය රු.350 ක් ලෙස දක්වා තිබුණු නමුත් ඇස්තමේන්තු ගත පිරිවැය හා ඇණවුම් පිරිවැය අතර සියයට 1674 ක විචලනය පිළිබඳව අවධානය යොමු නොකර ඒකක 7,000 ක් ඒකකයක් රු. 6,208.72 බැගින් රු.මිලියන 43.46 කට මිලදී ගැනීම සඳහා ඇනවුම ප්‍රදානය කර තිබුණි. | ඇස්තමේන්තුගත පිරිවැය ලෙස දක්වා ඇත්තේ වෛද්‍ය සැපයුම් අංශය දක්වා ඇති වටිනාකම වන බව, ඇතැම් අවස්ථාවල එම මිලට සමාන ලංසු ලැබී නොතිබුණු බව, මෙම ප්‍රසම්පාදනයේදී තුන්වරක් ලංසු කැදවා අවසානයේ ලැබුණු එකම පිළිගත හැකි ලංසුවට ඇණවුම ප්‍රදානය කර ඇති බව හා අත්‍යවශ්‍ය ඖෂධයක් වන මෙම ඖෂධය එම මිලට මිලදී නොගත්තේ නම් එම ඖෂධය හිඟවීම වැලැක්විය නොහැකි වනු ඇති බව. | ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂිත වෛද්‍ය සැපයුම්වල ඇස්තමේන්තුගත මිල ගණන් හා ලංසු මිල ගණන් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව සිය ඇගයීම්වලදී ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්විය යුතුය. |
| (iii) | Epoetin Injection 1,000IU, 2,000IU, 4,000IU, 5,000IU හා 10,000IU/Vial pre- filled syringe එකම එන්නතක විවිධ මාත්‍රාවන් වන අතර 2018 හා 2019 වර්ෂයන් සඳහා වෛද්‍ය සැපයීම් අංශයේ අවශ්‍යතාවය වෙනුවෙන් මෙම එන්නතෙහි 1,000IU ට අමතරව 2,000IU එන්නතක් USD 0.9 ක් බැගින්ද, 10,000 IU එන්නතක් USD 5.5 ක් බැගින්ද මිලදී ගෙන තිබුණි. එම මාත්‍රා මිලදී ගෙන තිබුණු ඒකක පිරිවැය හා සැසඳීමේදී සංස්ථාව විසින් මිලදී | මෙම මාත්‍රාව පළමුවරට මිලදී ගෙන තිබුණේ මෙම ප්‍රසම්පාදනයේදී වන බව, මාත්‍රාවේ ප්‍රමාණය අනුව පමණක් ඖෂධවල මිල සංසන්දනය කළ නොහැකි බව හා ඇනවුමේ ප්‍රමාණය හා නිෂ්පාදන සංකුලතා වැනි කරුණු මත මිල විචලනය වන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| | ගෙන තිබුණු Epoetin Injection 1,000IUඒකකයක පිරිවැය වූ USD 34.79 අසාමාන්‍ය මිලක් වන බව නිරීක්ෂණය විය. | | |
| (iv) | කොන්ත්‍රාත් ගිවිසුමේ 10 වගන්තිය ප්‍රකාරව, ඖෂධ සැපයීමේ දින 42 ක ප්‍රමාදය සඳහා USD 8,523.55 කට සමාන රු.මිලියන 1.56 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට හෝ කාර්යසාධන සුරක්ෂණය කල් ඉකුත්වීමට ප්‍රථම මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුල් ඇණවුම නිකුත් කළ දිනෙන් පසුව සැපයුම තහවුරු කරගැනීම සඳහා ගතයුතු අතරමැදි පියවර කිහිපයක් වෙනුවෙන් කාලය ගත කර තිබුණු බව හා ඇනවුම තහවුරු කරන ලද දින සිට නිකුත් කළ ණයවර ලිපියේ කාලසීමාව තුළ සැපයුම සිදුකර ඇති බැවින් ප්‍රමාද ගාස්තු අයකර නොමැති බව. | ගිවිසුම් කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (v) | 2018 වර්ෂය සඳහාවූ ගැණුම් ඇණවුමට අනුව Epoetin Injection 1000IU එන්නත් 7,000 ක් හැකි ඉක්මනින් වෛද්‍ය සැපයීම් අංශයට සැපයිය යුතු බව සැපයුම්කරු වෙත දන්වා තිබුණු අතර 2019 ජූලි 19 දිනැති වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂගේ ලිපිය මගින් මෙම එන්නත් තොගය හදිසි බව දන්වා තිබුණි. 2018 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල සහ දකුණු කොළඹ ශික්ෂණ රෝහල විසින් මෙම එන්නතින් ඒකක 3,000 ක් සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණද විගණිත දිනය වූ 2020 ජූලි 06 දින වන විටත් එම රෝහල් විසින් එකම එන්නත් ඒකකයක් හෝ වෛද්‍ය සැපයීම් අංශයෙන් ලබා ගෙන නොතිබුණි. තවද මෙම එන්නත සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණු රෝහල් 10 ක් වෙත ඒකක 906 ක්ද ඇතුළුව ඒකක 1,388 ක් බෙදාහැර තිබුණු නමුත් විගණිත දිනය වූ 2020 ජූලි 16 දින වන විටත් එන්නත් ඒකක 5,612 ක තොගයක් ඉතිරි වී තිබුණි. ඒ අනුව මෙම ඖෂධයේ හදිසියක් පැවති බව තහවුරු නොකෙරුණි. | ප්‍රමාදය සංස්ථාවේ පාලනයෙන් තොර හේතුන් මත සිදුවී ඇති බව, 2020 පෙබරවාරි 11 දින සංස්ථාව විසින් තොගය වෛද්‍ය සැපයීම් අංශය වෙත බාරදී ඇති බව හා තොග පාලනය හා බෙදාහැරීම සංස්ථාවේ කාර්යභාරයක් නොව වෛද්‍ය සැපයීම් අංශයේ කාර්යභාරය වන බව. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (vi) | රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් 2018 සහ 2019 යන වර්ෂ සඳහා Epoetin Injection 1000IU එන්නතින් පිළිවෙලින් ඒකක 100 සහ ඒකක 200 බැගින් වෛද්‍ය සැපයීම් අංශයෙන් ඉල්ලුම්කර තිබුණු නමුත් 2020 ජූලි 01 දින වන විටත් එකම එන්නත් ඒකකයක් හෝ ලබා | -එම- | මෙම ප්‍රසම්පාදන සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙන නොතිබුණි. Epoetin Injection 1000IU එන්නත 2017 වර්ෂයේදී ඖෂධ ඇස්තමේන්තුවට ඇතුළත්වූ පසු සුළු ප්‍රමාන වලින් ඇනවුම් කළත් අත්‍යවශ්‍ය නොවූ නිසා වෛද්‍ය සැපයීම් අංශයෙන් ලබා නොගත් බව එම රෝහලේ අදාළ නිලධාරීන් විසින් තහවුරු කරන ලදී. | | |
| (vii) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ අංක 109 වන වගන්තිය අනුව ජීවිතයක් බේරාගැනීම සඳහා හෝ බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීම සඳහා වැනි විශේෂ අවස්ථානුගත කරුණු වලදී හෝ වෙනත් යම් ජාතික අවශ්‍යතාවයක් සඳහා හෝ ජාතික ආරක්ෂාව සඳහා ඖෂධ, වෛද්‍ය උපකරණ හෝ සීමාස්ථ නිෂ්පාදන නිශ්චිත ප්‍රමාණවලින් ආනයනය කිරීමට සහ සැපයීමට අධිකාරිය විසින් අවසරය ලබාදිය හැකිය. 2018 අවශ්‍යතාවයට අදාළව Epoetin Injection 1,000IU/Vial pre- filled syringe ඇණවුම ප්‍රදානය කළ සැපයුම්කරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිවී නොතිබීම හේතුවෙන් එම ඖෂධ ආනයනය කිරීමට සහ සැපයීමට ලියාපදිංචියෙන් නිදහස්වීමේ ලිපියක් (Waiver of registration-WOR) නිකුත් කරන ලෙස සංස්ථාව විසින් 2019 ජුනි 21 දින එම අධිකාරිය වෙත ඉල්ලීම් කර තිබුණි. නමුත් මෙම එන්නත් ආනයනය කිරීමේ අත්‍යාවශ්‍ය, හදිසි හෝ ජාතික අවශ්‍යතාවය කුමක්ද යන්න අනාවරණය නොකෙරුණි. | මෙම ඖෂධය හා සියලු ඖෂධවල අවශ්‍යතාවය තීරණය කරනුයේ වෛද්‍ය සැපයීම් අංශය බව හා ඒ අනුව වෛද්‍ය සැපයීම් අංශයෙන් ලද උපදෙස් හා ඉල්ලීම් අනුව WOR සඳහා ඉල්ලුම් කර ඇති බව. | -එම- |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය සඳහා සමුච්චිත සංස්ථාපිත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සමුච්චිත සංස්ථාපිත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |